

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# *කාර්යය සාධන වාර්තාව 2018*




## “ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි”


**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. 0812213022

ෆැක්ස් : 0812213033

ඊමේල් :info@revenuedept.cp.gov.lk

cpcrevenue@gmail.com

වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

## 1. හැඳින්වීම

### 1.1. දැක්ම

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

### 1.2. මෙහෙවර

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3. අරමුණු හා කාර්යයන්

**අ)** ආදායම් ඉලක්ක සපුරා ගැනීම

1. 2018 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1655 ක් එකතු කිරීම
2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 1.5ක් එකතු කිරීම
3. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 6ක් එකතු කිරීම
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම

**ආ)** නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

**ඇ)** වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

**ඈ)** තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

**ඉ)** තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

**ඊ)** යහපාලනය

## 1.4. මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මඟින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හඳුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.

- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිම් ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

වර්තමානයේ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන බදු හා ගාස්තු

1. පිරිවැටුම් බද්ද -1991 සිට 2010 (4) කාර්තුව දක්වා වූ හිඟ පිරිවැටුම් බදු පමණි.
2. මුද්දර ගාස්තු - 1991 සිට ක්‍රියාත්මක වේ.
3. ඔට්ටු බද්ද - 1997 සිට ක්‍රියාත්මක වේ.
4. ඛණිජ අයිතීන් පිළිබඳ බද්ද - 2014 (2) කාර්තුවේ සිට ක්‍රියාත්මක වේ.
5. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ගාස්තු - 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක වේ.




**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenuedept.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

**1.5.**



## 1.6. කාර්ය මණ්ඩල තොරතුරු

2018-12-31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව හා සටින සංඛ්‍යාව

| තනතුර | අනුමත සංඛ්‍යාව | වැ කේ | සිටින සංඛ්‍යාව | සෘජු බඳවා ගැනීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| නියෝජ්‍ය ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| තක්සේරුකරු | 14 | SL-1 | 13 | පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු හෝ 2වන පන්තියේ උපාධියක් / වරලත් හෝ එකාබද්ධ ගණකාධිකාරීන් |
| බදු නිලධාරී | 22 | MN-5 | 18 | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, / වරලත් ගණකාධිකාර ආවසරික2/ CIMA 3වන මට්ටම |
| සංවර්ධන නිලධාරී | 12 | MN-4 | 11 | |
| රා.කළමනාකරණ සහකාර | 6 | MN-2 | 6 | |
| රියදුරු | 3 | PL-III | 3 | |
| කාර්යාල කාර්ය සහායක | 4 | PL-I | 3 | |
| | | | | |
| **එකතුව** | **63** | | **56** | |

## 2. 2018 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන් හා ඉටුකළ කාර්යයන්

### ආදායම් ඉලක්කය 2018 වර්ෂය

| ආදායම් ප්‍රභවය | | දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් | පළාත් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් |
|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,655,000,000 | 1,655,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 1,500,000 | *25,000,000 |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද | 6,000,000 | 6,000,000 |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | 2,750,000 | **11,000,000 |
| 05 | ඔට්ටු බද්ද | 50,000 | 100,000 |
| | එකතුව | 1,665,300,000 | 1,697,100,000 |

* පිරිවැටුම් බදු පැනවීම 2011 වසරේ සිට අත්හිටුවා ඇති අතර අයකර ගැනීමට ඇති මුළු හිග පිරිවැටුම් බදු ප්‍රමාණයද රුපියල් මිලියන 28.8 පමණ වේ. මෙම ප්‍රමාණය තුළ ද නීතිපති උපදෙස් විමසා ඇති මුත් සැලසුම් සකස් කරන දින වන විට පිළිතුරු නොලද රු.මිලියන 5.4 ක් ද, ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා නිදහස් කිරීමට යෝජිත රු.මිලියන 9 ක් පමණ ද ඇත. එනිසා පිරිවැටුම් බදු සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය ප්‍රායෝගික නොවේ.

** බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ බඩු උකස්ගන්නා ව්‍යාපාර වලින් ලබා ගන්නා ඇප තැන්පතු ආදායමක් ලෙස සැලකිය නොහැකි අතර එය දෙපාර්තමේන්තුවට වගකීමකි. ඇප තැන්පත් මුදල් හා ලියාපදිංචි ගාස්තුව එක් ව්‍යාපාරයක් වෙනුවෙන් අයකරනු ලබන්නේ එක් වරක් පමණක් වන අතර රු. 5000.00ක බලපත්‍ර ගාස්තුව පමණක් වාර්ෂිකව අයකරනු ලබයි. බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරවල කැපී පෙනෙන වර්ධනයක් වාර්ෂිකව අපේක්ෂා කල නොහැකි බැවින් පළාත් අයවැය දෙපාර්තමේන්තුවේ ඉලක්ක ලගාකර ගැනීම ප්‍රායෝගික නොවේ.

### 2018 වර්ෂය තුළදී අරමුණු කරා ළගාවීමේ ප්‍රගතිය

| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2018 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළගා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,655,000,000 | 1,847,081,901 | 111% |
| 02 | හිග පිරිවැටුම් බදු | 1,500,000 | 1,636,239 | 109% |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද | 6,000,000 | 4,337,802 | 72% |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>• බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු<br>• අය කරන ලද දඩ | 2,750,000 | 3,370,000<br>81,000 | 122% |
| 05 | ඔට්ටු බද්ද | 50,000 | *31,792 | 64% |
| | එකතුව | 1,665,300,000 | 1,856,538,734 | 111% |


(* ඔට්ටු බද්ද යටතේ ආදායම වැඩි වීමට නම් පුද්ගලයින් අල්ලන ඔට්ටු ප්‍රමාණය වැඩි විය යුතුය. එය ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින නීති රාමුව තුළ දෙපාර්තමේන්තුවට කටයුතු කළ නොහැකි අතර, පුද්ගලයින් අල්ලන ඔට්ටු මත බදු අයකර ගැනීම සිදු වේ.)

**2018 වර්ෂයේ ඉටුකළ කාර්යයන්**

**අ) 2017 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1847 ක් එකතු කිරීම**

2018 වර්ෂයේ දෙපාර්තමේන්තු ආදායම් ඉලක්ක අභිබවා 11% ක වර්ධනයක් සමග රුපියල් මිලියන 1847ක මුද්දර ගාස්තු ආදායමක් රැස්කර ගැනීමට පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම තුළින් 2018 වර්ෂය තුළ රැස් කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම රුපියල් 111,353,311.00කි. එය 2017 වසරට සාපේක්ෂව 34% වර්ධනයකි. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වැඩි ප්‍රමාණයක් මුද්දර ගාස්තු ගෙවීම් පරීක්ෂා කිරීම සඳහා යෙදවීමත්, දේපල පිහිටි ස්ථාන පරීක්ෂාවන් සංඛ්‍යාව වැඩි කිරීමත්, දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම කාර්යය මණ්ඩලයේ කෂේත්‍රයේ පලපුරුද්ද හා වෘත්තීය නිපුනතා වැඩිදියුණු කර ගැනීමත්, අතිරේක මුද්දර ගාස්තු වල කැපී පෙනෙන වර්ධනයට හේතු ලෙස සඳහන් කළ හැකිය.




**2.1 රූප සටහන**
**2012 සිට රැස්කරන ලද මුද්දර ගාස්තු ආදායම**

තවද, වෙළඳපොළ වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් නොතාරිස්වරුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳව නිරන්තර අධීක්ෂණය නිසා නියමිත වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීමේ යහපත් ප්‍රවනතාවයක් දිනෙන් දින වර්ධනය වෙමින් පවති.

### ආ) පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 1.5ක් එකතු කිරීම

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම කරන අතර පිරිවැටුම් බදු පැනවීමක් සිදු නොවේ.

2018 වර්ෂයට ඉලක්කගත කළ හිඟ පිරිවැටුම් බදු ආදායම වන රු.1,500,000/- ක් වූ අතර වර්ෂය තුළ රුපියල් **1,636,239.00** ක් රැස් කරගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. එය වාර්ෂික ඉලක්කය **109%** කින් ලඟා කර ගැනීමකි. ඒ සඳහා නඩු පැවරීම් 16 ක් 2018 වසර තුළ සිදුකර ඇත.

මුළු හිඟ පිරිවැටුම් බදු ශේෂය 2018වසරේදී රු. 27,061,275/= ක් දක්වා අඩුකර ගැනීමට හැකි වුණද ගෙනු 47කට අදාලව ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා රු. 5,738,466/= ක මුදලක් අය කර ගැනීමට නොහැකි තත්වයේ පවතින බව ස්ථිරව හඳුනාගෙන ඇත. ඉතිරි ගොනුවල ද කටයුතු කරගෙන යාමේදී, ව්‍යාපාර ආයතන නොමැති වීම, පුද්ගලයින් නොමැති වීම, පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම බදු ගෙවීමේ අනුකූලතාවය අඩු වීම යන කරුණු මත හිඟ පිරිවැටුම් බදු අයකර ගැනීම ඉතාමත් අසීරු කාර්යයක් වී ඇත.

### ඇ) ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 6ක් එකතු කිරීම

2018 වර්ෂයේ ඉලක්කගත ඛනිජ අයිතීන් පිළිබඳ බදු ආදායම වන රු.6,000,000/- ක් වුවද රැස්කරගත හැකිවූ ඛනිජ බදු ආදායම රු.4,337,802/-කි. 2018 වසර තුළ රටේ පැවති දේශපාලනික හා ආර්ථික අර්බුදයන් හමුවේ රටේ සංවර්ධන ව්‍යාපෘතිවල පැවති මන්දගාමී ස්වභාවයත්, පාරිසරික සාදක මත ඛනිජ ද්‍රව්‍ය කැණීම සඳහා බලපත්‍ර නිකුත්කිරීමේ සීමාවන්ද ඛනිජ බදු ආදායමේ අඩුවීමට හේතු වී ඇත. 2018 වසර තුළදී වාර්තා නොසැපයීම මත නඩු පැවරීම් 85 ක් ද සිදු කරන ලදී.

### ඈ) බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

මේ යටතේ දෙපාර්තමේන්තු ඉලක්කය වූ රු. 2,750,000/- අභිබවා 122%ක වර්ධනයක් සමග රු. 3,370,000/- ක බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තුවක් එකතු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. එයට අමතරව රු. 81,000/- ක දඩ ආදායමක් ද 2018 වසරේදී රැස්කර ඇත. මේවන විට බඩු උකස් ගන්නන් සියලු දෙනා විසින්ම ඇප තැන්පතු තැන්පත් කර ඇති අතර, නව ව්‍යාපාරිකයන් සියලුදෙනා විසින් ඇප තැන්පතු වලට අමතරව ලියාපදිංචි ගාස්තු ද ගෙවා අවසන් ය. ඉදිරි කාලයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු මේ යටතේ ප්‍රධාන ආදායම වනු ඇත.

### ඉ) නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

### ඊ) වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

- ආදායම් සේවයේ සියලුම නිලධාරීන් සඳහා දේපල කළමනාකරණය සම්බන්ධව එක් දින පුහුණු වැඩ සටහනක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේදී පැවැත්වීම
- සමුපකාර සංවර්ධන පුහුණු ආයතනය මගින් පවත්වන ලද පරිගනක ජාලගතකරනණය සම්බන්ධව පුහුණු පාඨමාලාවක් සඳහා නිලධාරීන් හත දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී කරවීම
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වන ලද GIS තාක්ෂණය පිළිබඳව හය දින නේවාසික පුහුණු පාඨමාලාවට හා GIS තාක්ෂණය පිළිබඳ උසස් පාඨමාලාව (හය දින නේවාසික පුහුණු පාඨමාලාව) සඳහා නිලධාරීන් හය දෙනෙකු සහභාගී කරවීම
- 2018 වර්ෂය තුළ දී පිරිස් හා පුහුණ අංශය මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩමුළු සඳහා සේවා අවශ්‍යතා අනුව නිලධාරීන් සහභාගී කරවා ඇත.

## උ) තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

- Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සෑදීමේ කටයුතු අවසන් අදියරට පැමිණ ඇත. 2019 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.
- පරිගනක වැඩසටහන් සැකසීම සම්බන්ධව පුහුණු පාඨමාලාව හදෑරූ නිලධාරීන් කණ්ඩායමේ සහයෝගය ඇතිව ආයතනය තුළදීම ඉදිරි තොරතුරු තාක්ෂණ සංවර්ධන කටයුතු කිරීමට ද අපේක්ෂිතයි.

## ඌ) තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

- 2018 වසරේ දී මේ යටතේ බනිජ බදු ගෙවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක්ද, බඩු උකස් ගන්නා ව්‍යාපාරිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක්ද, මුද්දර ගාස්තු සම්බන්ධව ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 24 ක්ද සිදුකර ඇත.
- එයට අමතරව දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාමෙන් ආකෘති පත්‍ර හා දැන්වීම් මඟින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

## 2018 ක්‍රියාකාරි සැලැස්ම සැලසුම අනුව කාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළගාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1655 | **ආදායම රු.මිලයන**<br>1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරිම<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරිම<br>4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරිම<br>5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම.<br>6. ගොනු විශ්ලේෂණය කිරිම. (ආකෘති පත්‍ර 300,101 හා 190 මගින්)<br>7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම.<br>8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරිම.<br>ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම<br>iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව.<br>iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව<br>9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරීම<br>10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල)<br>11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම<br>12. තොරතුරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 1,655<br>26000<br>8000<br>8000<br>8500<br>රු.මිලි.80<br>1500<br>6000<br>1700<br>25<br>65 | 1,847<br>26602<br>11365<br>12391<br>රු.මිලි.111<br>1567<br>7551<br>2257<br>21<br>64 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි.6 | **ආදායම රු.මිලයන**<br>1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරිම<br>2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරිම<br>3. ලිපිගොනු ආවේක්ෂණය කිරිම<br>4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරිම<br>5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම<br>6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 6,0<br>3000<br>3000<br>1500<br>40<br>සියල්ලම<br>60 | 4,3<br>3900<br>2748<br>2407<br>26<br><br>85 |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ගාස්තු හා තැන්පතු රු.මිලි. 2.75 | 1. වාර්ෂික බලපත්‍ර ගාස්තු | රු.මිලි. 2.75 | රු.මිලි.3.37 |
| | අය හා හිඟ බදු අංශය<br>හිඟ පිරිවැටුම් රු.මිලි. 1.5 | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම<br>2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරිම (D 7)<br>3. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.<br>4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරිම<br>5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | සියල්ලම<br>250<br>50<br>සියල්ලම | <br>85<br>16 |


| | | | | |
|---|---|---|---|---|
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එළ කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | දැන්වත් කිරීමේ වැඩසටහන් 36ක් පවත්වන ලදී |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. ක්‍රියාත්මක කිරීමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>4. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම<br>3. ක්‍රියාත්මක කිරීම | 1 | |
| 3. ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4.පිරිවැය හඳුනාගැනීම. | | පුහුණු වැඩසටහන් 9ක් සිදුකර ඇත |
| | තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම<br>3. Web Base පරිගණක වැඩසටහනක් සැකසීම | | අවසන් අදියරේ ඇත |
| 4. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | |

ඉහත සියලුම දත්තයන් නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙන් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉහත වගුව සකස්කර ඇත.

## 2.1 2018 වාර්ෂික ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන හා ප්‍රගතිය

2018 වසරේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන හා ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

| විස්තරය | ඇස්තමේන්තුව රු. | වැය කළ මුදල රු. | ප්‍රගතිය |
|---|---|---|---|
| 1. දෙපාර්තමේන්තුවට ප්‍රවිශ්ඨවීමේ ප්‍රධාන දොරටුවක් සඳහා ගේට්ටුවක් සවිකරගැනීම සහ පිවිසුම් මාර්ග අළුත්වැඩියා කරගැනීම | 650,000.00 | 650,000.00 | නිමකර ඇත |
| 2. ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහල ඇතුළත තීන්ත ආලේප කිරීම | 750,000,00 | 750,000,00 | නිමකර ඇත |
| 3. සාකච්ඡා මේස, පුටු මිලදී ගැනීම හා කාර්යාල මේස මෙලමයින් බෝඩ් වලින් මේස සකස් කිරීම | 1,100,000.00 | 1,100,000.00 | නිමකර ඇත |
| 4. පරිගණක යන්ත්‍ර,යූ.පී.එස්. යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම හා වායුසමීකරණ යන්ත්‍ර 3ක් සවිකිරීම | 1,500,000.00 | 1,500,000.00 | පරිගණක යන්ත්‍ර 7ක්, යූ.පී.එස්. යන්ත්‍ර 9ක්, මුද්‍රණ යන්ත්‍ර 2ක් මිලදී ගෙන ඇති අතර වායුසමීකරණ යන්ත්‍ර 3ක් සවිකරන ලදී |



**2.2 රූප සටහන**

දෙපාර්තමේන්තුවට ප්‍රවිශ්ඨවීමේ ප්‍රධාන දොරටුව සඳහා සවිකළ නව ගේට්ටුව



**2.3 රූප සටහන**

දෙපාර්තමේන්තුවේ පිවිසුම් මාර්ගය අළුත්වැඩියා කිරීමෙන් පසු



**2.4 රූප සටහන**

කාර්යාල මේස මෙලමයින් බෝඩ් වලින් සකස් කිරීමෙන් අනතුරුව



**2.5 රූප සටහන**
මිලදී ගන්නා ලද සාකච්ඡා මේසය හා පුටු

## 2.2 විශේෂ ජයග්‍රහණ

2018 වසරේදී පැවති, 2016 ගිණුම් වර්ෂයට අදාල රාජ්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ කාර්යය සාධනය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් සිදුකරනු ලැබූ ඇගයීම් ක්‍රියාවලියේ දී මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව රන් සම්මානයෙන් පුදනු ලැබීම මෙම වසර තුළ දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණයයි.



**2.6 රූප සටහන**
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් ලද රන් සම්මානය

## 2.3 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

2018 වර්ෂයේදී පැවති ඵලදායිතා තරගාවලියේ දී පළාත් අංශයෙන් ඵලදායිතා විශේෂ කුසලතා සම්මානය දිනා ගැනීම අප දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි.

## 2.4 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

උක්ත වැඩසටහන යටතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 4.5ක ආධාර මුදලක් ලැබුණු අතර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වෘත්තීමය නිපුණතාවය හා ආකල්ප වර්ධනය, ප්‍රදේශයේ ප්‍රජාව බදු හා ගාස්තු සම්බන්ධව දැනුවත් කිරීම, නවීන තාක්ෂණය රාජකාරී කටයුතු සඳහා යොදාගැනීම යන කාරණා තුළින් පළාතේ ආදායම් ඉපැයීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව කරගත හැකිවන සේ විවිධ වැඩසටහන් එමගින් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් සම්බන්ධ විස්තර පහත සටහනේ සැකෙවින් දක්වා ඇත.

| විස්තරය | වැයකළ මුදල රු. | ප්‍රතිලාභ |
|---|---|---|
| • මුද්දර ගාස්තු සම්බන්ධව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 24ක් ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් පැවැත්වීම | 652,319.00 | ග්‍රාම නිලධාරීන් 1350ක් දැනුවත් කිරීම |
| • පළාතේ බඩු උකස් ගන්නා ව්‍යාපාරිකයින්, ග්‍රාමීය බැංකු, පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක් පැවැත්වීම | 248,903.00 | බඩු උකස් ගන්නා ව්‍යාපාරිකයන් 469 ක් දැනුවත් කිරීම |
| • බනිජ බදු ගෙවන්නන් හා එම ප්‍රදේශවල පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් පැවැත්වීම | 298,718.00 | බනිජ බදු ගෙවන්නන් හා එම ප්‍රදේශවල පාසල් සිසුන් 530ක් දැනුවත් කිරීම |
| • Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සෑදීම | 875,463.00 | උවසන් අදියරේ පවතින අතර මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය |
| • පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන GIS තාක්ෂණය සම්බන්ධව මූලික හා උසස් නේවාසික පාඨමාලාවන් සඳහා නිලධාරීන් යොමුකිරීම | 225,083.00 | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 6ක් පුහුණුව ලැබීම |
| • ආකල්ප සංවර්ධන වැඩසටහන් 2ක් පැවැත්වීම | 53,925.00 | දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සහභාගී විය |
| • මහනුවර, ගම්පොල, මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් ගෙන්වා හිමිකම් සහතික පිළිබඳව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | 21,730.00 | දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් සහභාගී විය |
| • දේපල තක්සේරුකරණය හා ගොඩනැගිලි තක්සේරුකරණය පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුහුණු පාඨමාලාවන් 2ක් සඳහා නිලධාරීන් යොමු කිරීම | 408,691.00 | ආදායම් සේවයේ සියළුම නිලධාරීන් සහභාගී විය |
| • පොල්ගොල්ල NICD ආයතනයේ පැවති Linux, Server Management, Database Management සම්බන්ධ පුහුණු පාඨමාලාවන් 2ක් සඳහා නිලධාරීන් 6 දෙනෙකු යොමු කිරීම | 466,773.00 | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 6ක් පුහුණුව ලැබීය |
| • දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන පරිගණක හා තාක්ෂනික උපකරණ මිලදීගැනීම | 1,248,395.00 | GPS යන්ත්‍ර 2ක්, Scaner යන්ත්‍ර 3ක්, Server යන්ත්‍ර 2ක්, UPS 1ක්, Laptop 3ක් දෙපාර්තමේන්තුවට මිලදී ගන්නා ලදී |



**2.7 රූප සටහන**
මුද්දර ගාස්තු සම්බන්ධව ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්
ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන අතරතුරේදී



**2.8 රූප සටහන**
වීල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ඛනිජ බදු ගෙවන්නන් හා
එම ප්‍රදේයේ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන



**2.9 රූප සටහන**
මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති බඩු උකස් ගන්නා ව්‍යාපාරිකයින්, ග්‍රාමීය බැංකු,
පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන




**2.10 රූප සටහන**

ආකල්ප සංවර්ධනය හා මහජන සම්බන්ධතා සම්බන්ධයෙන් රත්මලාන කාර්මික විද්‍යාලයේ කථිකාචාර්ය අසංක ජයරත්න මහතාගේ දේශනයට සහභාගී වෙමින්



**2.11 රූප සටහන**

පොල්ගොල්ල NICD ආයතනයේ පැවති Linux, Server Management, Database Management සම්බන්ධ පුහුණු පාඨමාලාවට නිලධාරීන් සහභාගී වෙමින්



**2.12 රූප සටහන**

දේපල තක්සේරුකරණය පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පැවති පුහුණු පාඨමාලාවට දෙපාර්තමේන්තුවේ ආදායම් සේවයේ නිලධාරීන් සහභාගී වෙමින්



**2.13 රූප සටහන**
පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලැබූ GIS තාක්ෂණය සම්බන්ධව මූලික පාඨමාලාවට සහභාගී වෙමින්



**2.14 රූප සටහන**
දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කරන ලද නව Server යන්ත්‍ර

2018 වසරේ දී ඉහතින් පෙන්නුම් කළ කාර්යය සාධනයක් ළඟා කරගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම හිටපු ගරු ආණ්ඩුකාරතුමිය හා ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන්, හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2018 වසරේ දී ලද අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්, ලබා දී ඇති ආදායම් ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීම අපගේ ඒකායන අරමුණයි.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)
පළාත් ආදායම් කොමසාරිස්
මධ්‍යම පළාත